# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2331/18 – 2023 මැයි මස 09 වැනි අඟහරුවාදා – 2023.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/208.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්. චේතුක සමන්ත මයා, දෙවනිය වත්ත, බදුරුප්ප පාර, ගම්මැද්ද, මීදිගම, අහංගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, කොග්ගල ඩිපෝව, හබරාදූව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, අංක 117 හි, සිරි සිංගප්පුලි මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දීය.

1A – G 039437 – 14 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2020/208.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්. චේතුක සමන්ත මයා, දෙවනිය වත්ත, බදුරුප්ප පාර, ගම්මැද්ද, මීදිගම, අහංගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, කොග්ගල ඩිපෝව, හබරාදූව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු** වනුයේ –

"එල්. චේතුක සමන්ත මයා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ III පෙළ විදුලි කාර්මිකයෙකු වශයෙන් කොග්ගල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2014.02.09 දින ඇති වූ සිද්ධියක් පදනම් කරගෙන පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව සේවයෙන් පහ කළ ද එම කරුණු සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු විභාගයෙන් අනතුරුව නිදොස් කොට නිදහස් කිරීම හේතුවෙන් සේවය අවසන් කරමින් ලබා දී ඇති දඬුවම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 05 – 0040

---

මගේ අංකය: IR/COM/03/2022/35.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නීතිඥ වසන්ත විජේසේකර මයා, (එම්. සී. ඒ. ආර්ටෝල්ට් ක්‍රිස්ටේල්ලේ මයා, ආර්. රෝහිත් චෞධරි මයා, රාජේෂ් කේ. නාරාන්ග් මයා යන මහත්වරුන් වෙනුවෙන්), 655, සුභූති මාවත, සුභූතිපුර, බත්තරමුල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 04, බම්බලපිටිය, ගාලු පාර, අංක 411/16 හි, නීතීඥ ආර්. නවෝදයම් මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/03/2022/35.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නීතීඥ වසන්ත විජේසේකර මයා, (එම්. සී. ඒ. ආර්ටෝල්ට් ක්‍රිස්ටේල්ලේ මයා, ආර්. රෝහිත් චෞධරි මයා, රාජේෂ් කේ. නාරාන්ග් මයා යන මහත්වරුන් වෙනුවෙන්), 655, සුභූති මාවත, සුභූතිපුර, බත්තරමුල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ** –

"අවුරුදු 05 ක සේවා ගිවිසුමක් යටතේ ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත කපිතාන්වරුන් වශයෙන් බැඳුණු එම්. සී. ඒ. ආර්ටෝල්ට් ක්‍රිස්ටේල්ලේ මයා, ආර්. රෝහිත් චෞධරි මයා, රජේෂ් කේ. නාරාන්ග් මයා යන අය 2020.04.01 දින සිට 2021.01.13 දින දක්වා අනිවාර්ය නිවාඩු යැවීම කාර්මික ආරාවුල් පනතේ විධිවිධානවලට අනුව නීත්‍යානුකූල ද එකී අනිවාර්ය නිවාඩු යවා තිබූ කාලයට අදාළව වැටුප් හා සේවා ගිවිසුමේ සඳහන් සියලු දීමනා හිමි ද යන්නත් හිමිනම් එය නොගෙවීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට ලැබිය යුතු සහනයන් මොනවා ද යන්නත් පිළිබඳව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 05 – 0041

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.